සැ. යු. - 2014.09.26 වැනි දින පළ වූ අංක 1882 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,883 - 2014 ඔක්තෝබර් මස 03 වැනි සිකුරාදා - 2014.10.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

	පිටුව		පිටුව
ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය	—	රජයේ නිවේදන	866
ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ...	—	මිල පාලන දැන්වීම්	—
අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ...	—	ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්	—
රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය	—	ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන	—
අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය	—	ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා	—
වෙනත් පත්කිරීම් ආදිය	—	විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්	869
රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය	—	නැවියන්ට දැන්වීම්	—
		සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම්	—

සැ. යු.- චන්ද්‍රකුමාර් සමාජ සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2014 සැප්තැම්බර් මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පල කරන ලදී.

සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ඔක්තෝබර් මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 ඔක්තෝබර් මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

865 – B 080879—300 (2014/10)

රජයේ නිවේදන

වන්දනා ගමන් ආඥාපනත

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් (175 වැනි අධිකාරය වූ) වන්දනා ගමන් ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ සාදනු ලබන නියෝග.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍ය.

2014 සැප්තැම්බර් මස 10 වැනි දින,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

නියෝග

1. මේ නියෝග "හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ගිරිහඬු රජමහා විහාරස්ථානයේ දුරුතු මහ පෙරහැර නියෝග" යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ නියෝගවල-

"කඳවුරු පෙදෙස" යන්නෙන් මෙහි උපලේඛනයෙහි විස්තර කරනු ලැබ ඇති ප්‍රදේශ අදහස් වේ.

"දිස්ත්‍රික් ලේකම්/දිසාපති" යන්නෙන් හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා අදහස් වන අතර, ඔහු විසින් 4 වැනි නියෝගය යටතේ බලය පවරනු ලැබූ යම් නිලධාරියෙක් ද ඊට ඇතුළත් වේ.

"වෛද්‍ය නිලධරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ.

"වන්දනාකරු" යන්නෙන් කඳවුරු පෙදෙසට ඇතුළත් වී කවර හෝ කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස තුළ නතර වී සිටින යම් තැනැත්තෙක් අදහස් වේ.

"පොලිස් නිලධාරියා" යන්නෙන් කඳවුර පෙදෙස භාර යම් ග්‍රාම සේවා නිලධරයෙක් ද අදයස් වේ.

"මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා" යන්නෙන් කඳවුරු පෙදෙස භාර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා අදහස් වේ.

3. "හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කයේ අම්බලන්තොට" ගිරිහඬු රජමහා විහාරස්ථානයේ දුරුතු මහා පෙරහැර සඳහා කෙරෙන වන්දනා ගමන් සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

4. මේ නියෝග යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වෙත පැවරී ඇති යම් බලයක් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නියම වී ඇති යම් කාර්යයක් ඉටු කිරීම සඳහා යම් රජයේ නිලධාරියකු වෙත ලිඛිතව බලය පැවරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය.

5. (1) කඳවුරු පෙදෙස තුළට හෝ කඳවුරු පෙදෙසින් පිටතට හෝ කඳවුරු පෙදෙස ඇතුළත හෝ වාහන ගමනා ගමනය හෝ පයින් ගමන් කිරීම විධිමත් කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපති වරයාට බලය ඇත්තේ ය.

(2) මේ නියෝග ය (1) වැනි ඡේදයේ තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහිලා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් පොලිස් නිලධරයකුට දෙන ලද උපදෙස්වලට අනුකූලව එම පොලිස් නිලධරයා විසින් කරනු ලබන යම් නීත්‍යනුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙකු විසින් ක්‍රියා නොකරනු ලැබිය යුතු ය.

6. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරය නොමැතිව කිසිම තැනැත්තකු විසින් කිසිම ගවයකු හෝ වෙනත් යම් සතෙකු හෝ කඳවුර පෙදෙස තුළට ගෙන ඒම නොකළ යුතු ය.

එසේ වුව ද, 7 වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් නවතා තැබීම සඳහා වෙන් කරනු ලැබ ඇති ස්ථානයක් කරා, කරත්ත ගෙනයාම හෝ ගොනුන් දක්කාගෙන යාම හෝ සම්බන්ධයෙන් අවසර ලබා ගැනීම අවශ්‍ය නොවන්නේ ය.

7. (1) කඳවුර පෙදෙස ඇතුළත පහත සඳහන් ස්ථාන වෙන් කර තැබීමට හෝ සැපයීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට බලය ඇත්තේ ය :

(අ) බස්රථ හා වෙනත් මෝටර් වාහන නවතා තබන ස්ථාන ;
(ආ) කරත්ත නවත්වා තැබීමේ හා ගොනුන් බැඳ තැබීමේ ස්ථාන ;
(ඇ) එක් එක් වන්දනා නඩයට නවාතැන් ගැනීම පිණිස වෙන වෙනම ස්ථාන ;
(ඈ) අසනීප වන වන්දනා කරුවන් සඳහා සුරැකුම් ස්ථාන ;
(ඉ) සිඟමන් යැදීමට සහ පිනට ඉල්ලා ගැනීම් කිරීම සඳහා ස්ථාන ;
(ඊ) විකිණීම සඳහා යම් ද්‍රව්‍ය ප්‍රදර්ශනය කරනු ලබන ස්ථාන ;
(උ) වෙනත් පුහුණු කටයුතු සඳහා තාවකාලික මඩු ඉදි කිරීමට හැකි ස්ථාන ;
(ඌ) සේදීමේ සහ ස්නානය කිරීමේ කාර්යය සඳහා වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ ස්ථාන ;
(එ) බීමට ජලය ලබා ගැනීම සඳහා වන්දනා කරුවන්ගේ ප්‍රයෝජනය පිණිස වූ වැව්, ළිං, දිය වලවල් හා, සහ එවැනි පහසුකම් සලසන වෙනත් සථාන ;
(ඒ) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකන වෙනත් කාර්යයන් සඳහා වූ ස්ථාන.

(2) අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා සලකනු ලැබුවහොත් ඔහු විසින් (1) වැනි ඡේදයේ නිශ්චිතව සඳහන් පරිදි යම් ප්‍රදේශයක් වෙන් කරනු ලැබ ඇත්තේ කවර කාර්යයක් සඳහාදැයි දැක්වෙන දැන්වීමක් හෝ නාම පුවරුවක් එකී එක් එක් ස්ථානයෙහි තැබීමට කටයුතු සැලැස්විය හැකි ය.

(3) (1) වැනි ඡේදය යටතේ වූ යම් කාර්යයක් සඳහා යම් ස්ථානයක් වෙන් කරනු ලැබූ හෝ සපයනු ලැබ ඇති අවස්ථාවක දී ඒ ස්ථානය හුදෙක් එම කාර්යය සඳහා පමණක් ම පාවිච්චි කරනු ලැබිය යුතු අතර, කඳවුරු පෙදෙස ඇතුළත වෙනත් කිසිම ස්ථානයක් එම කාර්යය සඳහා කිසිම තැනැත්තෙකු විසින් පාවිච්චි නොකරනු ලැබිය යුතු ය.

8. රෝග වළක්වාලීම සඳහා කඳවුරු පෙදෙස තුළ යම් වැවකට, ලිඳකට, දිය වලකට හෝ ජලාශයකට ක්ලෝරීන් යෙදීම හෝ යම් වැවක්, ලිඳක්, දිය වලක් හෝ ජලාශයක් වසා දැමීම හෝ අවශ්‍ය යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට හෝ වෛද්‍ය නිලධරයාට හෝ බලය ඇත්තේ ය.

9. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් තත් කාර්යය සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක බලය මත සහ එවැනි අවසර පත්‍රයක සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට අනුකූලව මිස, යම් තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා කඳවුරු පෙදෙස් තුළ වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් හෝ තැනීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් කොටසක් එකතු කිරීම හෝ නොකරනු ලැබිය යුතු ය.

(2) යම් තැනැත්තෙකු විසින් මේ නියෝගයේ (1) වැනි ඡේදයට පටහැනි වන පරිදි යම් මඩුවක් හෝ යම් තාවකාලික හෝ ස්ථිර ඉදිකිරීමක් සාදනු ලැබීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට හෝ ඉදි කිරීමකට අලුතින් කොටසක් තැනීම හෝ එකතු කිරීම හෝ කරනු ලැබුවහොත් ඒ තැනැත්තා වෙත ලිඛිත දැන්වීමක් භාර දීමෙන් පසු එම දැන්වීමේ සඳහන් කරනු ලබන කාල සීමාව ඇතුළත අවස්ථාවෝචිත පරිදි එම මඩුව හෝ ඉදි කිරීම හෝ දැනට පවත්නා ගොඩනැගිල්ලකට අලුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කරන ලෙස හෝ කඩා දමන ලෙස දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් එම තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(3) මෙම නියෝගයේ (2) ඡේදය යටතේ දැන්වීමක් භාර දෙනු ලැබූ යම් තැනැත්තකු විසින් එහි සඳහන් කාල සීමාව තුළ ඒ දැන්වීමේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක හෝ එම දැන්වීම භාර දෙනු ලැබිය යුතු නියම තැනැත්තා කවරෙක් ද යන්න පිළිබඳව සැකයක් උද්ගත වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ මඩුව හෝ ඉදිකිරීම හෝ දැනට පවත්නා යම් ගොඩනැගිල්ලකට අලුතින් එකතු කරන ලද කොටස හෝ ඉවත් කිරීමට හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන කම්කරුවන්, උපකරණ සහ යන්ත්‍රෝපකරණ සහිතව දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුළු වනු ලැබීම ද, එය ඉවත් කිරීම හෝ කඩා දැමීම සඳහා අවශ්‍ය වන සියලු දේ කිරීම හෝ එසේ කිරීමට දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සලස්වනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

10. වන්දනාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා වෙන් කරන ලද බවට දැන්වීමක් හෝ සංඥා පුවරුවක් මගින් පෙන්වා ඇති යම් වැසිකිළියක හැර කිසිම තැනැත්තකු විසින් කඳවුරු පෙදෙස තුළ මළමුත්‍රා පහ කිරීම නොකරනු ලැබිය යුතු ය.

11. කඳවුරු පෙදෙස තුළ යම් වැවක, ළිඳක, දිය වළක, ජලාශයක, ඇළක දොළක හෝ දිය පාරක ඇති ජලය කිසිම තැනැත්තෙකු විසින් අපිරිසිදු නොකරනු ලැබිය යුතු ය.

12. කැළිකසළ දැමීම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් සපයනු ලැබ ඇති ස්ථානයකට හෝ භාජනයකට මිස කිසිම තැනැත්තකු විසින් කඳවුරු පෙදෙස තුළ ද්‍රව්‍යමය හෝ ද්‍රව්‍යමය කැළිකසළ දැමීම නොකරනු ලැබිය යුතු ය.

13. (1) කඳවුරු පෙදෙස තුළ වන්දනාකරුවන්ට පිසූ ආහාර පාන බෙදා හැරීමේ විධිමත් කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) තමා වෙත මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා දිස්ත්‍රික් ලේකම්/ දිසාපතිවරයා විසින් දෙනු ලබන උපදෙස්වලට අනුකූලව යම් පොලිස් නිලධරයකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකු විසින් හෝ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට කිසිම තැනැත්තකු අකීකරු නොවිය යුතු ය.

14. (1) කඳවුරු පෙදෙස තුළ විකිණීම සඳහා වන්දනාකරුවන්ට බෙදා දීම සඳහා ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති යම් ආහාරයක් හෝ පානයක් අපවිත්‍ර වී ඇති බව හෝ මනුෂ්‍ය පරිභෝජනය සඳහා නුසුදුසු වී ඇති බව පෙනී ගිය අවස්ථාවක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් හෝ වෛද්‍ය නිලධාරිවරයා විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් හෝ ඒ ආහාරය හෝ පානය මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරනු ලැබිය හැකි ය.

(2) මේ නියෝගයේ (1) වැනි ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද ආහාරයක් හෝ පානයක් කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ විකිණීම හෝ බෙදා හැරීම හෝ නොකරනු ලැබිය යුතුය.

(3) මෙම නියෝගයේ (1) වැනි ඡේදය යටතේ මනුෂ්‍ය පරිභෝජනයට නුසුදුසු බවට ප්‍රකාශ කරන ලද යම් ආහාරයක් හෝ පානයක් විකිණීම හෝ බෙදා හැරීම තහනම් කිරීම සහ ඒවා විනාශ කිරීම යම් පොලිස් නිලධරයෙකු විසින් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක වරයෙකු විසින් තහනමට ගෙන විනාශ කර දමනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

15. බේකරියක්, රස කැවිලි හලක්, හෝ රස කැවිලි නිෂ්පාදනාගාරයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් පවත්වාගෙන යාම සඳහා දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය මත සහ ඒ බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව මිස කිසිම තැනැත්තෙකු විසින් 7 වැනි නියෝගය යටතේ යම් කාර්යයක් සඳහා වෙන් කරනු ලැබ තිබෙන හෝ සපයනු ලැබ තිබෙන ස්ථානයක හෝ කඳවුරු පෙදෙස තුළ අන් ස්ථානයක හෝ එවැනි බේකරියක්, රස කැවිලි හලක් හෝ රස කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් පිහිටුවීම හෝ පවත්වාගෙන යාම නොකරනු ලැබිය යුතුය. සෑම බලපත්‍රයක්ම වෛද්‍ය නිලධරයාගේ හෝ වෛද්‍ය නිලධරයා විසින් බලය දෙනු ලැබූ වෙනත් යම් තැනැත්තකුගේ හෝ නිර්දේශය මත ගාස්තුවකින් තොරව නිකුත් කරනු ලැබිය යුතු ය.

16. කඳවුරු පෙදෙස තුළ ඇති සියලුම බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර සහ දන්සැල් සහ ඒවායේ ඇති සියලු ගෘහ භාණ්ඩ සහ උපකරණ පිරිසිදු සහ සනීපාරක්ෂාවට හිතකර තත්ත්වයකින් තබා ගත යුතු ය.

17. කඳවුරු පෙදෙස ඇතුළත විකිණීම සඳහා හෝ බෙදා හැරීම සඳහා හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති හෝ තබා ඇති සියලුම කේක් වර්ග, රස කැවිලි සහ පිසින ලද ආහාර වෛද්‍ය නිලධරයා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ සෑහීමකට පත්වන පරිදි මැස්සන්ට ඇතුල්විය නොහැකි පරිදි නිසි ලෙස තනන ලද වීදුරු ආවරණය තුළ තැබීම කරනු ලැබිය යුතු ය.

18. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය, කිරි අපද්‍රව්‍ය හෝ යම් ආහාරයක හෝ පානයක ඉතිරි වූ කොටස් හෝ පිසීමේ දී හෝ අන් අයුරකින් ඉවතලන ද්‍රව්‍ය හෝ කඳවුරු පෙදෙසේ කිසිම ස්ථානයක අනාවරණයව නොතිබිය යුතු ය. එවැනි සියලු අපද්‍රව්‍ය ඉතුරු වූ කොටස් හෝ ඉවතලන ද්‍රව්‍ය 19 වැනි නියෝගයෙහි විධිවිධාන සලසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතු ය. එවැනි සියලු අපද්‍රව්‍ය, කසළ හෝ ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුරු පෙදෙස ඇතුළත යම් ස්ථානයක හෝ ඒ අසළ පොළවේ විසිකොට තිබෙන බව පෙනී ගියහොත් ඒ ස්ථානයෙහි අයිතිකරු විසින් හෝ ප්‍රධාන

පදිංචිකරු විසින් හෝ ඒ ස්ථානය බේකරියක්, රස කැවිලි හලක්, රස කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සැලක් වන අවස්ථාවක ඒ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් හෝ එම වරද සිදුවීම වැළැක්වීමට අවශ්‍ය සියලුම පූර්වෝපාය යෙදූ බව සහ නිසි සැලකිල්ලෙන් ක්‍රියා කළ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස එකී අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලපත්‍රලාභියා හෝ මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සලකනු ලැබේ.

19. කඳවුරු පෙදෙස තුළ පිහිටි සියලු බේකරි, රස කැවිලි හල්, රස කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර, දන්සැල් සහ වෙළඳ හෝ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝන මීටර් 1 1/2කට (ඝන අඩි 4 1/2ට) නොඅඩු ධාරිතාවයක් ඇති දැවමය, ලෝහමය හෝ ප්ලාස්ටික් කසළ බඳුනක් සපයනු ලැබිය යුතු අතර, එකී කසල බඳුන එහි කසළ තැන්පත් කරනු ලබන විට හෝ ඉන් කසළ ඉවත් කරනු ලබන විට හෝ හැර වෙනත් සෑම අවස්ථාවකදීම දැවමය, ලෝහමය, ප්ලාස්ටික්, පියනකින් වසා තැබිය යුතු ය.

20. (1) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ මතය අනුව මෙය නියෝග වල 16, 17, 18 හෝ 19 වැනි නියෝග කඩකරමින් පිහිටුවනු ලැබ ඇත්තා වූ හෝ පවත්වාගෙන යනු ලබන්නා වූ ද, යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක්, දන්සැලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීමේ හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේ නම්, එකී බලපත්‍රය වහාම අවලංගු කිරීමේ බලය දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට ඇත්තේ ය.

(2) යම් බේකරියක් හෝ කැවිලිහලක්, හෝ කැවිලි සාදන ස්ථානයක් හෝ භෝජනාගාරයක් හෝ දන්සැලක් හෝ යම් වෙළඳ හෝ ව්‍යාපාරික ස්ථානයක් බාරව සිටින යම් තැනැත්තෙකු විසින් මේ වගන්තියේ (1) වැනි ඡේදය යටතේ දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ යම් නීත්‍යානුකූල විධානයකට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

21. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුලු නොවිය යුතුය.

22. (1) කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් පැතිරී යන විටක දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් වන්දනා කරුවන්ට කඳවුරු පෙදෙසින් වහාම පිටවන ලෙස නියම කරනු ලැබීම ද, ඉවත්ව යා යුතු ගමන් මාර්ගය සහ ඉවත්ව යාමේ දී උපයෝගී කරගත යුතු ප්‍රවාහන ක්‍රමය හා පිළිවෙල දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් නියම කරනු ලැබීම ද නීත්‍යානුකූල වන්නේ ය.

(2) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින් මෙම වගන්තියේ (i) වැනි ඡේදය යටතේ දෙනු ලබන යම් නීත්‍යානුකූල නියමයකට පටහැනිව කිසිම තැනැත්තෙක් ක්‍රියා නොකළ යුතුය.

23. කඳවුරු පෙදෙස තුළ යම් වසංගත රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති සෑම තැනැත්තෙක් ම ද එසේ යම් ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති බව දැන දැනම ඒ තැනැත්තා සමඟ එකට වාසය කරන සෑම තැනැත්තෙක් ම ද, ඒ බව වෛද්‍ය නිලධරයාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධරයෙකුට හෝ වහාම වාර්තා කළ යුතු ය.

24. ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන හෝ පෙළෙන්නේ යැයි තමා දන්නා කිසිම තැනැත්තකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් භෝජනාගාරයක් හෝ දන්සැලක් තත් කාලයේ භාරව සිටින යම් තැනැත්තකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයකට, භෝජනාගාරයට හෝ දන්සැලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් හෝ ආහාර පාන හෝ බෙදා හැරීමේ දී, විකිණීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේ දී හෝ සහභාගී වීමට හෝ ඉඩ නොදෙනු ලැබිය යුතු ය.

25. යම් බේකරියක, කැවිලි හලක හෝ කැවිලි සාදන ස්ථානයක, භෝජනාගාරයක හෝ දන්සැලක බලපත්‍රධාරියෙකු විසින් හෝ යම් නවාතැන්පළක හෝ වන්දනාකරුවන්ගේ විශ්‍රාම ශාලාවක අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් හෝ පෙළෙන යම් තැනැත්තෙකුට අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියේ, කැවිලිහලේ හෝ කැවිලි සාදන ස්ථානයේ භෝජනාගාරයේ, දන්සැලේ නවාතැන්පලේ හෝ වන්දනා කරුවන්ගේ විශ්‍රාම ශාලාවේ කවර හෝ කාලසීමාවක් නැවතී සිටීමට ඉඩ නොදිය යුතුය. එවැනි ස්ථානයක ආසාදන රෝගියෙකු හෝ ස්පර්ශක රෝගියෙකු සිටින බව අනාවරණය වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එහි බලපත්‍රධාරී විසින් හෝ අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් හෝ එම කරුණ වහාම වෛද්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියෙකුට වාර්තා කළ යුතු ය.

26. 7 වැනි නියෝගය යටතේ හිඟමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයක දී හැර කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීම හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතු ය.

27. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාගේ ලිඛිත අවසරයක් නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කඳවුරු පෙදෙස තුළ ගිනිකෙළි භාණ්ඩ හෝ ගිනි අවි කිසිවක් පත්තු කිරීම නොකළ යුතු ය.

28. 7 වැනි නියෝගය හෝ 10 වැනි නියෝගය යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතු ය.

29. දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා, වෛද්‍ය නිලධරයා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා, හෝ යම් පොලිස් නිලධරයෙකු විසින්,

(අ) මේ නියෝග අතුරෙන් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුළුවීම ; සහ,

(ආ) 7 වැනි නියෝගය යටතේ යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් ප්‍රදර්ශනය කර තැබීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදිකිරීමක් ගොඩනැගීම නීත්‍යානුකූල වන්නේ ය.

(30) දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයා විසින්,

(අ) 6 වැනි නියෝගය හෝ 27 වැනි නියෝගය යටතේ දෙන ලද යම් අවසරයක්,

(ආ) 9 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද අවසර පත්‍රයක්, සහ

(ඇ) 15 වැනි නියෝගය යටතේ නිකුත් කරන ලද යම් බලපත්‍රයක්

අවලංගු කිරීම යෝග්‍ය යැයි හෝ මහජන යහපත පිණිස වන්නේ යැයි දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරයාට පෙනී යන්නේ නම්, ඔහු විසින් කවර හෝ වෙලාවක ඒ එසේ අවලංගු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

උපලේඛනය

හම්බන්තොට දිස්ත්‍රික්කයේ, නැගෙනහිර ගිරුවාපත්තුවේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 146 පුහුල්යාය ග්‍රාම නිලධාරී වසමට අයත් අම්බන්තොට ගිරිහඬු රජමහා විහාරස්ථානය පිහිටි භූමි භාගය.

ඊට මායිම් පහත දැක්වෙන පරිදි වේ :

උතුරට : අ.ග.පි. 466 - තවාළුවිල ගමේ කැබලි අංක 143C, 141, 143C, 141 සහ වලවේ ගඟ ද ;

දකුණට : අ.ග.පි. 466 - තවාළුවිල ගමේ කැබලි අංක 141A සහ 139A;

නැගෙනහිරට : වලවේ ගඟද ;

බස්නාහිරට : අ.ග.පි. 466 - තවාළුවිල ගමේ කැබලි අංක 139A, ප්‍රාදේශීය සභා මාර්ගය, අ.ග.පි. 466 තවාළුවිල ගමේ කැබලි අංක 143C, 141, 143C, 141 ද වේ.

10 - 250

විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2014 ජූනි 27 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව නමට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. එන්. ඩබ්ලිව්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද අංක 28246 සහ 2012 අප්‍රේල් 10 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම් (මෙහි මින් ඉදිරියට "ණයගැණුම්කරු" යනුවෙන් සඳහන් කරන) කඩවත, කංකානම් ගමගේ දොන් තිලකසිරි යන අය විසින් පැහැර හැර තිබෙන හෙයින් ද,

2014 අප්‍රේල් මස 30 වැනි දිනට ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව එකී, කංකානම් ගමගේ දොන් තිලකසිරි යන අයගෙන් රුපියල් අසූදෙලක්ෂ හතළිස් හත්දහස් දෙසිය විසිපහකුත් ශත දහයක (රු.82,47,225/10) මුදලක් සහ 2014 මැයි මස 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැත්තෑහත් ලක්ෂ තිස්පන් දහස් නවසිය හැත්තෑ අටකුත් ශත තිස්හතරක් (රු.77,35,978.34) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යයක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හයක් (6%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන වාර්ෂික අනුපාතිකය මත වැඩිදුර පොළිය ද ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු රුපියල් අසූදෙලක්ෂ හතළිස් හත්දහස් දෙසිය විසිපහකුත් ශත දහයක (රු.82,47.225.10) මුදල සහ 2014 මැයි මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැත්තෑහත් ලක්ෂ තිස්පන් දහස් නවසිය හැත්තෑ අටකුත් ශත තිස්හතරක් (රු.77,35,978.34) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට හයක් (6%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලනු ලබන වාර්ෂික අනුපාතිකය මත වැඩිදුර පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී අංක 28246 දරන උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තුද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 28246 දරන උකස් බැඳුම්කරය මගින් එකී කංකානම් ගමගේ දොන් තිලකසිරි යන අය විසින් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 28246 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සීමාව ඇතුළත, කැළණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණු තලවතුහේන්පිට ග්‍රාමසේවා වසමේ, දකුණු තලවතුහේන්පිට පිහිටි කැන්දහේන, නොහොත් කැන්දලන්ද නැමති ඉඩමේ, බලයලත් මානක කේ. ඒ. රූපසිංහ මැන සකස් කළ අංක 477/2000 හා 2000.07.23 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරු - නැගෙනහිරට : දැනට ඩබ්ලිව්. කේ. අනෝරිස් සිංඤෝට අයිති ඉඩම ද, දකුණු - නැගෙනහිරට : අංක 4658 දරන පිඹුරේ ලොට් B දරන, දැනට එම්. එම්. වී. එෆ් පෙරේරාට අයිති ඉඩම ද, දකුණු - බස්නාහිරට : බලයලත් මානක සුගත් සමරවික්‍රම මැන සකස් කළ අංක 66/1995 පිඹුරේ ලොට් 1B2 සහ 1B1 ලකුණු කළ බිම් කට්ටි ද, උතුරු -බස්නාහිරට : කලින් එස්. රිචඩ් පෙරේරාට අයිතිව තිබුණු ඉඩම ද යන මායිම් ඇතුළත පර්චස් විසිහතරකුත් දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 24.25) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

මෙයට මෙහි පහත විස්තර කරන බිම් කට්ටි මතින් මාර්ග අයිතියද ඇතුළත් වේ.

1. ඉහත කී දකුණු තලවතුහේන්පිට පිහිටි කැන්දහේන නොහොත් කැන්දලන්ද නමැති ඉඩමේ බලයලත් මානක වී. එෆ්. ජේ. පර්මි මැන සකස් කළ අංක 4658 හා 1971.01.12 දින දරන පිඹුරේ නිරූපිත (අඩි 4 ක් පළල පාර) වූ ලොට් C දරන බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ උතුරු නැගෙනහිරට ලොට් B ද, දකුණු - නැගෙනහිරට : ප්‍රධාන පාර දිගට පාර

සඳහා වෙන් වූ බිම ද දකුණු බස්නාහිරට ඩබ්ලිව්. කේ. ඇග්නස් පෙරේරාගේ ඉඩම ද උතුරු - බස්නාහිරට ලොට් A ද යන මායිම් ඇතුළත පර්චස් තුනකුත් දශම පහක් (අ. 0, රූ. 0, පර්. 3.5) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කට්ටිය. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

2. ඉහත කී දකුණු තලවතුහේන්පිට පිහිටි කැන්දහේන නොහොත් කැන්දලන්ද නමැති ඉඩමේ බලයලත් මානක සුගත් සමරවික්‍රම මැන සකස් කළ අංක 176/1992 හා 1992.07.14 දින දරන පිඹුරේ ලොට් අංක 3 ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වූ උතුරු - නැගෙනහිරට ලොට් අංක 1 සහ ලොට් අංක 2 (අඩි 4 ක් පළල පාරක් සඳහා වෙන් වූ බිම) ද දකුණු-නැගෙනහිරට : ලොට් අංක 4 (අඩි 8ක් පළල පාර සඳහා වෙන් වූ බිම්) ද දකුණු-බස්නාහිරට : අංක 11695 දරන පිඹුරේ ලොට් 1B කට්ටියේ දැනට ඩබ්ලිව්. කේ. ඇග්නස් පෙරේරාට අයිති ඉතිරි කොටස ද, උතුරු - බස්නාහිරට : අංක 11695 දරන පිඹුරේ ලොට් 1B කට්ටියේ දැනට ඩබ්ලිව්. කේ. ඇග්නස් පෙරේරාට අයිති ඉතිරි කොටස ද යන මායිම් ඇතුළත පර්චස් දෙකයි දශම හතරයි පහක් (අ.0, රූ. 0, පර්. 2.45) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කට්ටිය. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

3. ඉහත කී දකුණු තලවතුහේන්පිට පිහිටි කැන්දහේන නොහොත් කැන්දලන්ද නමැති ඉඩමේ ඉහත කී අංක 176/1992 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 4 ලකුණු කළ (අඩි 8 ක් පළල පාර) වූ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම් උතුරු - නැගෙනහිරට : ලොට් අංක 2 (අඩි 4 ක් පළල පාරක් සඳහා වෙන් වූ බිම) ද, දකුණු-නැගෙනහිරට : ලොට් අංක 1A සහ අංක 11695 දරන පිඹුරේ ලොට් 1B කට්ටියේ ඉතිරි කොටස ද, දකුණු - බස්නාහිරට : ලොට් අංක 6 ද, උතුරු-බස්නාහිරට : අංක 11695 පිඹුරේ ලොට් 1B කට්ටියේ දැනට ඩබ්ලිව්. කේ. ඇග්නස් පෙරේරාට අයිති ඉතිරි කොටස සහ ලොට් අංක 3 (අඩි 4 ප්‍රවේශය) ද යන මායිම් ඇතුළත පර්චස් එකකුත් දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 1.25) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කට්ටිය. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

4. ඉහත කී දකුණු තලවතුහේන්පිට පිහිටි කැන්දහේන නොහොත් කැන්දලන්ද නමැති ඉඩමේ ඉහත කී අංක 176/1992 දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 5 ලකුණු කළ (අඩි 12 ක් පළල පාර) වූ බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම් උතුරු - නැගෙනහිරට අංක 11695 පිඹුරේ ලොට් 1B කට්ටියේ දැනට ඩබ්ලිව්. කේ. ඇග්නස් පෙරේරාට අයිති ඉතිරි කොටස සහ ලොට් අංක 4 (අඩි 4 ප්‍රවේශය) ද, දකුණු - නැගෙනහිරට : (කිරිබත්ගොඩ - උඩුපිල) පාර සඳහා රිසවේසම ද දකුණු - බස්නාහිරට: දැනට ඩබ්ලිව්. ජේ. පෙරේරාට අයිති ඉඩම ද, උතුරු බස්නාහිරට : අංක 3995 පිඹුරේ ලොට් 2 ද යන මායිම් ඇතුළත පර්චස් දෙකයි දශම හයයි පහක් (අ. 0, රූ, 0, පර්. 2.65) බිම් ප්‍රමාණයෙන් යුත් බිම් කට්ටිය. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

මෙයට ඉහත කී අංක 477/2000 දරන පිඹුරේ ලොට් අංක 1B/2, K හා 2 දරන බිම් කට්ටි මතින් මාර්ග හිමිකම ප්‍රයෝජනයට ගැනීමේ අයිතිවාසකම ද ඇතුලත් වේ.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී,
අංක73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

10-280

ඩීඑෆ්සීසී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2014 ජූලි 30 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැංකුව නමට මඩකලපුව ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ගයාතිරි විසින් ලියා සහතික කරන ලද අංක 433 සහ 2013 මාර්තු 27 දින දරන උකස් බැඳුම්කරය මත, අයවිය යුතු මුදල් ගෙවීම, (මෙහි මින් ඉදිරියට "හවුල් ගැනුම්කරුවන්" ලෙස හඳුන්වනු ලබන) දෙදෙනාම මඩකලපුවේ වාසය කරන පොන්නුදුරෙයි සුදාකරන් යනුවෙන්ද හැඳින්වෙන පොන්නුදුරෙයි සුදාහරන් සහ වාසුකී සුදාකරන් විවාහට පෙර නඩරාසා යනුවෙන්ද හැඳින්වෙන නඩරාසා වාසුකී යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2014 මැයි 31 වැනි දිනට ඉහත කී පොන්නුදුරෙයි සුදාකරන් යනුවෙන් ද හැඳින්වෙන පොන්නුදුරෙයි සුදාහරන් සහ වාසුකී සුදාකරන් විවාහයට පෙර නඩරාසා යනුවෙන්ද හැඳින්වෙන නඩරාසා වාසුකී යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හැත්තෑතුන් ලක්ෂ දහඅට දහස් හත්සිය හැටකුත් ශත හැත්තෑහතරක (රු.73,18,760.74) මුදලක් සහ 2014 ජූනි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැටහත්ලක්ෂ අනූනවදහස් නවසිය අනූහතරක් (රු. 67,99,994) සඳහා එක් එක් මාසයේ ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට අටකුත් දශම පහක් (8.5%) ඉහත අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් හැත්තෑතුන් ලක්ෂ දහඅට දහස් හත්සිය හැටකුත් ශත හැත්තෑහතරක (රු.73,18,760.74) මුදල සහ 2014 ජූනි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැටහත්ලක්ෂ අනූනව දහස් නවසිය අනූහතරක් (රු.67,99,994) සඳහා එක් එක් මාසයේ ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී ආර්.) වර්ෂයකට සියයට අටකුත් දශම පහක් (8.5%) ඉහල අනුපාතිකයක් වන ආසන්නතම ඉහල 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී අංක 433 දරන උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තුද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 433 දරන උකස් බැඳුම්කරය මගින් ඉහත කී පොන්නුදුරෙයි සුදාකරන් යනුවෙන් ද හැඳින්වෙන පොන්නුදුරෙයි සුදාහරන් සහ වාසුකී සුදාකරන් විවාහයට පෙර නඩරාසා යනුවෙන් ද හැඳින්වෙන නඩරාසා වාසුකී යන අය විසින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ

වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 433 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

1. නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, මාන්මුනෙයි පත්තුවේ, උප්පොඩෙයි හි පිහිටි බෙදා වෙන් කළ බිම් කොටසක් වූ උතුරටඃ සහ නැගෙනහිරට : පිලිප්පයියාගේ ඉඩම් ද, දකුණට : තංගරාසා මහේස්වරීගේ ඉඩම ද, බස්නාහිරට : පාක්කියම් පටුමඟ ද යන මායිම් ඇතුලත උතුරේ සිට දකුණට බඹ 11 කුත් අඩි 4 ක් ද, නැගෙනහිර සිට බස්නාහිරට : බඹ 12 1/2 ක් ද යන බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ ඊට අනුබද්ධ වූ සියලු අයිතිවාසිකම් ඇතුළත් ය.

මෑතක දී මැන සකස් කළ පිඹුරකට අනුව මෙම ඉඩම පහත දැක්වෙන පරිදි විස්තර කර තිබේ.

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, උතුරු මාන්මුනයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පෙරියඋප්පොඩයි ග්‍රාමසේවක වසමේ, මාන්මුනයි පත්තුවේ, මඩකලපුව මහ නගර සභා ප්‍රාදේශය ඇතුළත අංක 8 මහ නගර සභා කොට්ඨාසයේ, සීලමුනයි ග්‍රාමයේ, පාක්කියම් පටුමගේ පිහිටි වරිපනම් අංක 50 දරන ඉඩම වන බලයලත් මානක ඒ. ඊ. කේ. තිස්සවීරසිංහ මැන සකස් කළ අංක 15/2013 හා 2013.01.14 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01 ලකුණු කළ බිම් කොටසට මායිම්, උතුරටඃ දැනට ජෝතිනායගම් හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : දැනට මනෝහරන් මහතා සහ මහත්මිය හිමිකම් කියන වත්ත ද, දකුණට : දැනට ටී. මහේස්වරී හිමිකම් කියන වත්ත ද, බස්නාහිරට : පාක්කියම් පටුමඟ ද යන මායිම් ඇතුලත හෙක්ටයාර් 0.0413 ක් බිම් ප්‍රමාණයෙන් හෝ පර්චස් දහසයකුත් දශම තුනයි තුනක් (අ. 0, රූ. 0, පර්. 16.33) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ. මෙයට එහි පිහිටි ගොඩනැගිල්ල, ළිඳ සහ ඊට අනුබද්ධ සියලු අයිතිවාසිකම් ඇතුළත් ය.

2. නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, උතුරු මාන්මුනයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පෙරියඋප්පොඩයි ග්‍රාමසේවක වසමේ, මාන්මුනයි පත්තුවේ, සීලමුනයි ග්‍රාමයේ, කොඩ්ඩමුනයි හි සකරියාස් පාරේ පිහිටි වරිපනම් අංක 39/18 දරන හා ඒ. ඊ. කේ. තිස්සවීරසිංහ බලයලත් මානක මැන සකස් කළ අංක 1628/2012 සහ 2012.12.03 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 01 ලකුණු කළ බිම් කොටස වූ උතුරු - නැගෙනහිරටඃ කන්නකායිගේ සහ එස්. සිවපාක්කියම්ගේ වතු හා බාර් පාරේ සිට සකරියාස් පාරට යන පටුමඟද, දකුණු - නැගෙනහිරට : බී. පවලකාන්තන්ගේ වත්ත ද, දකුණු බස්නාහිරට : එස්. ක්‍රිෂ්ණපිල්ලෙයිගේ වත්ත ද, උතුරු - බස්නාහිරටඃ වී. ප්‍රියාගේ වත්ත ද යන මායිම් ඇතුළත හෙක්ටයාර් 0.0734 ක් හෝ පර්චස් විසි නවයක් (අ. 0, රූ. 0, පර්. 29) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම වේ. මෙයට එහි පිහිටි ගොඩනැගිල්ල, ළිඳ සහ ඊට අනුබද්ධ සියලු අයිතිවාසිකම් ඇතුළත් ය.

මෙයට, මෙහි පහත විශේෂයෙන් විස්තර කරන භූමියෙන් හෝ එය ඔස්සේ හෝ එය මතින් උකස්කරුවන්ට ද ඔවුන්ගේ ආගන්තුකයන්ට ඉංජිනේරුවන්ට, කොන්ත්‍රාත්කරුවන්ට, ගෘහනිර්මාණ ශිල්පීන්ට, කම්කරුවන්ට, සේවකයින්ට, කුලී නිවැසියන්ට, අවසරලාභීන්ට සහ ආරාධිතයන්ටද පයින් හෝ අන්‍යාකාරයකින් සදාකල් දිවා හෝ රාත්‍රී කාලයේ ඔවුන්ගේ කැමැත්ත හා මනාපය පරිදි කවර වූ හෝ කාර්ය සඳහා යාම්එම් කිරීමට ද අසුන්, ගවයින්, හෝ වෙනත් සතුන් සහිතව හෝ නොමැතිව ද මෝටර් කාර්, මෝටර් ලොරි හෝ වෙනත් ඕනෑම වර්ගයකම හෝ විස්තරයකට අයත් වාහනවලින්, බරපටවා හෝ නොපටවා, ප්‍රවේශවීමේ හා පිටවීමේ සහ ප්‍රත්‍යාගමනය කිරීමේ අයිතිවාසිකමද ඒ සමඟ හිමි සියලු හා එක් එක් අයිතිවාසිකම්, ප්‍රතිලාභ හා අනුබන්ධනද ඒ බිම් මතින්, තුළින් හරහා සහ/හෝ ඔස්සේ විදුලි රැහැන් සහ මුදුන් කම්බි, ජලාපවහන, ගෑස්, ජලනල එලීමේ හෝ වෙනත් උවාරණ හෝ උපක්‍රම යෙදීමේ පූර්ණ හා බාධා විරහිත අයිතිවාසිකම, නිදහස හා අවසරය ඇතුළත් වේ.

නැගෙනහිර පළාතේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, උතුරු මාන්මුනයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 178 ඒ පෙරියඋප්පොඩයි ග්‍රාම සේවක වසමේ, සීලමුනයි අම්ර්තකලි හි පිහිටි වරිපනම් අංක 40 දරන බිම් කොටස වූ උතුරට : සිවපාක්කියම් මහත්මියගේ ඉතිරි ඉඩම ද, දකුණටඃ එස්. කනකායිගේ ඉඩම ද, නැගෙනහිරට : පාර සහ බස්නාහිරට : පටුමග ද යන මායිම් ඇතුළත පර්චස් දෙකකුත් දශම හයයි හතක් (අ. 0, රූ. 0, පර්. 2.67) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ ඊට අනුබද්ධ සියලු අයිතිවාසිකම්.

ඒ. ආර්. ප්‍රනාන්දු,
සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
73/5, ගාලු පාර,
කොළඹ 03.

10-281

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2014 අගෝස්තු 26 දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව නමට මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් සිසිල් පී. රාජරත්න විසින් ලියා සහතික කරන ලද අංක 1482 සහ 2011 ඔක්තෝබර් 14 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම මහනුවර පදිංචි කරවිට ආරච්චිගේ නිහාල් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2014 පෙබරවාරි මස 28 වැනි දිනට ඉහත කී කරවිට ආරච්චිගේ නිහාල් යන අයගෙන් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවට රුපියල් හැටනවලක්ෂ විසිඅටදහස් තුන්සිය දොළහකුත් ශත අනූවක (රු.69,28,312.90) මුදලක් සහ 2014 මාර්තු 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැටහතර ලක්ෂ අටසිය තිහකුත් ශත තුනක (රු.64,00,830.03) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට පහකුත් දශම පහක් (5.5%) ඉහල අනුපාතිකයක් මත ගණනය කරනු ලබන වාර්ෂික අනුපාතිකය වූ ආසන්නතම 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් හැටනවලක්ෂ විසිඅටදහස් තුන්සිය දොළහකුත් ශත අනූවක (රු.69,28,312.90) මුදල සහ 2014 මාර්තු 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් හැටහතර ලක්ෂ අටසිය තිහකුත් ශත තුනක (රු.64,00,830.03) මුදලක් සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්ලිව්. පී. ආර්) වර්ෂයකට සියයට පහකුත් දශම පහක් (5.5%) ඉහල අනුපාතිකයක් මත ගණනය කරනු ලබන වාර්ෂික අනුපාතිකය වූ ආසන්නතම 0.5% ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම, පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී අංක 1482 දරන උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තුද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 1482 දරන උකස් බැඳුම්කරය මතින් එකී කරවිට ආරච්චිගේ නිහාල් යන අය විසින් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය මහනුවර බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 1482 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපල විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහනගර සභා සීමාව ඇතුළත වටපුළුව ග්‍රාමයේ පිහිටි මල්ගහමුදුනේ වත්ත නොහොත් වත්තේගෙදරතැන්නේහේන නමැති ඉඩමේ, බලයලත් මානක ඒ. රාජපක්ෂ මැන සකස් කළ අංක 447 දරන පිඹුරේ ලොට් අංක 1 න් කොටසක් වන බලයලත් මානක ජී. ආර්. ඩබ්ලිව්. එම්. වීරකෝන් මැන සකස් කළ අංක 8684 හා 1997.03.31 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 2 ලෙස ලකුණු කළ බෙදා වෙන්කළ බිම් කට්ටිය වූ එකී ලොට් අංක 2 ලකුණු කළ බිම් කට්ටියට මායිම් උතුරට : එකී අංක 8684 දරන පිඹුරේ ලොට් අංක 4 දරන (පාර) ද, නැගෙනහිරට : එකී අංක 8684 දරන පිඹුරේ ලොට් අංක 3 ද, දකුණට : ඒ. ආර්. එම්. සියාතු සහ තවත් අය හිමිකම් කියන (වරිපනම් අංක 5/80) ඉඩම ද, බස්නාහිරට : එකී අංක 8684 දරන පිඹුරේ ලොට් අංක 1 ද යන මායිම් ඇතුළත පර්චස් එකොළහකුත් දශම පහක් (අ. 0, රූ. 0, පර්. 11.5) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙයට ලොට් අංක 4 දරන බිම් කට්ටිය මතින් වාහන සඳහා මාර්ග අයිතිය හා එකී බිම් කට්ටිය හා බෝමළුව පාරේ සිට එන මාර්ගය මතින් සහ ඔස්සේ දුරකථන රැහැන්, ජලනල හා විදුලි රැහැන් එළීමේ අයිතිවාසිකම ද ඇතුලත් වේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර තිබේ.

ලක්ෂ්මන් ද සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

10-279

යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී විසින් සම්මතය කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී (මෙහි මින්මතු "යූනියන් බැංකුව" වශයෙන් හඳුන්වනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2014 අගෝස්තු මස 01 වැනි දින පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, මොරටුව, ගොරකාන, ගාලු පාරේ අංක 306 දරන ස්ථානයේ පදිංචි නම්මුනි කමල් නිශාන්ත ද සොයිසා (ජා. හැ. අ. 731673497V) (මෙහි මින් මතු "බන්ධනදායී" වශයෙන් හඳුන්වනු ලබන) යන අය විසින් රුපියල් එක්කෝටි විසිලක්ෂයක (රු. 1,20,00,000) වාර ණයක් ද රුපියල් තිස්ලක්ෂයක (රු. 30,00,000) අයිරා පහසුකමක් ද, රුපියල් හතළිස් ලක්ෂයක (රු. 40,00,000) ඇපකර ලිපි ද වශයෙන් බැංකු පහසුකම් ලබා ගෙන ඇති බැවින් ද, එකී බන්ධනදායී විසින් ඉහත කී මූල්‍ය පහසුකම් නිසා යූනියන් බැංකුව වෙත අයවිය යුතු රුපියල් එක්කෝටි අනූලක්ෂයක (රු. 1,90,00,000) මුදල සහ ඒ මත පොළිය ගෙවීම සඳහා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. සී. පීරිස් විසින් රුපියල් එක්කෝටි අනූලක්ෂයක (රු. 1,90,00,000) මුදලක් සඳහා සහතික කරන ලද අංක 121 සහ 2013 ජුනි මස 20 දින දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය ලියා අත්සන් කිරීමෙන් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ ඇපයක් වශයෙන් යූනියන් බැංකුව වෙත උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඒ අනුව, ඉහත කී පහසුකම් නිසා ඍජු බැරකමක් වශයෙන් 2014 ජුනි මස 25 වන දිනට මුළු හිඟ මුදල වන රුපියල් දෙකෝටි දහහතරලක්ෂ අනූනවදහස් අටසිය හතළිස්පහකුත් ශත හැත්තෑඑකක (රු. 2,14,99,845.71) මුදල සහ 2014 ජුනි මස 26 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඒ මත පොළිය ද එකී බන්ධනදායීන්ගෙන් යූනියන් බැංකුව වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති බැවින් ද,

ඉහත කී ණය ශේෂය හෝ එයින් කොටසක් එකී බන්ධනදායී විසින් ගෙවා පියවා දැමීම පැහැර හැරීම සිදු කර ඇති බවට යූනියන් බැංකුව විසින් සෑහීමකට පත්වීමෙන් පසුව, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව යූනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ක්‍රියා කරමින්, ඉහත සඳහන් මූල්‍ය පහසුකම් නිසා රුපියල් දෙකෝටි දහහතරලක්ෂ අනූනවදහස් අටසිය හතළිස් පහකුත් ශත හැත්තෑ එකක (රු. 2,14,99,845.71) මුදල සහ ඒ මත 2014 ජුනි මස 26 වන දින සිට පොළිය ද, තව ද, ඉහත කී අංක 121 දරන බැඳුම්කරය සහ 1990 අංක 04 දරන එකී පනතේ 13 වන වගන්තිය ප්‍රකාරව, යූනියන් බැංකුව වෙත අයකර ගැනීමට හිමිකම් ඇති වෙනත් සියලු ම මුදල් ප්‍රමාණයන් ද, අයකර ගැනීම සඳහා ඉහත කී අංක 121 සහ 2013 ජුනි මස 26 දින දරන එකී උකස් බැඳුම්කරයේ බලය ප්‍රකාරව සහ ඊට යටත්ව යූනියන් බැංකුව වෙත උකසට තබන ලද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ ඉහත කී 1990 අංක 04 දරන පනත ප්‍රකාරව ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට බලයලත් වෙන්දේසිකරුවන් වන ත්‍රිවංක ඇන්ඩ් සේනානායක වෙත

බලය පැවරීමට 1990 අංක 4 දරන එකී පනතේ 4 වන වගන්තිය ප්‍රකාරව මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, තල්පිටි දෙබැද්දේ, පානදුර ප්‍රාදේශීය සභා බල සීමාවේ, කෙසෙල් වත්ත උප කාර්යාල සීමාවේ, පානදුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 674 දරන, ගොරකපොළ ග්‍රාමසේවා නිලධාරි වසමේ ගොරකපොළ පිහිටි, එස්. ජී. කුරුප්පු මාවතේ, වරිපනම් අංක 275/53 දරන, රතුවත්ත, කුරුඳුවත්ත, උළුගේවත්ත පාවුල ඕවිට සහ මොරගහවත්ත හෙවත් කෝන්ගහවත්ත පහෙන් එක් පංගුවක කොටසක් වශයෙන් හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 6401 සහ 2002 සැප්තැම්බර් මස 28 දින දරන මානක පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ බිම් කොටසට මායිම් උතුරට : ගාලු පාරේ සිට නිවෙස් දක්වා වැටී ඇති පාර ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ආර්. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 1978 දරන පිඹුරේ නිරූපිත මෙම ඉඩමේ ම කැබලි අංක B2B ද, දකුණට : අංක 3251 දරන පිඹුරේ නිරූපිත මෙම ඉඩමේ ම කැබලි අංක 2 ද, බස්නාහිරට : අංක 3251 දරන පිඹුරේ නිරූපිත මෙම ඉඩමේ ම කැබලි අංක 02 සහ අංක 5044 දරන පිඹුරේ නිරූපිත ඉඩම ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 6401 දරන මානක පිඹුරට අනුව පර්චස් තිස්හතයි දශම නවයයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 37.90) හෙවත් හෙක්ටයාර් 0.09589 විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ පළතුරු ආදී සෑම සියලුදේත් සමඟ ය.

ඉහත කී අංක 6401 දරන පිඹුරේ නිරූපිත ඉහත කී ඉඩම් කැබැල්ල නැවත මැන බෙදා වෙන් කිරීමට අනුව පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

ඉහත කී ගොරකපොළ පිහිටි රතුවත්ත, කුරුඳුවත්ත, උළුගේවත්ත, පාවුල ඕවිට සහ මොරගහවත්ත හෙවත් කෝන්ගහවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. වීරපනේ විසින් මැන සාදන ලද අංක 838 සහ 1997 පෙබරවාරි මස 17 දින දරන මානක පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 01 දරන කොටසට මායම් උතුරට : පාර ද, නැගෙනහිරට : බලයලත් මිනින්දෝරු ආර්. ඩබ්ලිව්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 1798 දරන පිඹුරේ නිරූපිත මෙම ඉඩමේ ම කැබලි අංක B2B ද, දකුණට : බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 3251 දරන පිඹුරේ කැබලි අංක 2 ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් මැන සාදන අංක 5064 දරන පිඹුරේ නිරූපිත ඉඩම් කැබැල්ල ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 838 දරන මානක පිඹුර අනුව පර්චස් තිස්හතයි දශම නවයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 37.90) විශාල ඉඩම් කැබැල්ල ය. මෙම ඉඩම පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F358/233 දරන වෙළුමේ/පත් ඉරුවේ යථා පරිදි ලියාපදිංචි කරන ලදුව, අංක F573/258 දරන වෙළුමට/පත් ඉරුවට ගෙන ගොස් ඇත.

තව ද, ඉහත ඉඩමේ උතුරු මායිමේ පිහිටි පාරේ මාර්ග අයිතිය ද සමඟ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස්. ඩී. එන්. එස්. කන්නන්ගර,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

10-276

කොළඹ යුනියන් බැංකුව

මණ්ඩලයේ යෝජනාව

බැංකු විසින් ණය අය කිරීමේ පනතේ අංක 04 - 1990 වගන්ති 04 (විශේෂ විධිවිධාන) යටතේ කොළඹ යුනියන් බැංකුව විසින් යෝජනා සම්මත කර ගන්නා ලද දැන්වීම

බැංකු මගින් ණය අය කිරීමේ පනතේ අංක 04-1990 වගන්ති 08 (විශේෂ විධිවිධාන) යටතේ නියමයන්ට අනුව කොළඹ යුනියන් බැංකුවේ (පීඑල්සී) මින්මතු යුනියන් බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකමතිකව 2014 ජූලි මස 04 වන දින සම්මත කර ගන්නා ලද දැන්වීමයි.

දීපාල් අරවින්ද කොළඹගේ (ජා.හැ.අ. 671660676V) යටතේ වූ අංක 321/2/ඒ, ගුවන් හමුදා පාර කුරණ, කටුනායක යන ලිපිනයේ පදිංචි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (මින්මතු බැඳි සිටින්නා යනුවෙන් හඳුන්වනු ලබන) වරින්වර බැංකු පහසුකම් මත සහ වාරික ණය වශයෙන් අයිරාවන් මත ණය ලබා ගෙන රුපියල් මිලියන 03ක් වූ මූලික ණය බැඳුම්කරයක් (අංක 1248 01/03/2010 දිනැති) සහ රුපියල් හය ලක්ෂයක දෙවන ණය බැඳුම්කරයක් (අංක 1379 සහ 2010.12.13 සහ රුපියල් මිලියන 1.5ක් කෙරිටරි ණය බැඳුම්කරයක් අංක 1621 සහ 2011.11.18 වැරදි නිවැරදි කිරීමේ ඔප්පු අංක 1821 සහ 2013.02.28 සමග කියවීමට ලියා අත්සන් කර මීගමුවේ ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. එල්. පී. ධම්මික සිල්වා මහතා විසින් ලියා සහතික කරන ලද ණයට සහ උකසට සුරැකුම් කොට පහත උපලේඛනයේ මනාව විස්තර කර ඇති දේපල කොළඹ යුනියන් බැංකුවේ පීඑල්සී රුපියල් මිලියන 5.5ක් සහ එයට අයත් පොළියද සමග ගෙවීමට (මින්මතු යුනියන් බැංකුව යැයි හඳුන්වනු ලබන) එකී අයිරාව සහ ණය වාරිකය පහසුකම් වෙනුවෙන් එකී බැඳි සිටින්නා විසින් යුනියන් බැංකුව වෙත ගෙවිය යුතු රුපියල් තුන් මිලියන පන්සිය විසි පන් ලක්ෂ පන්සිය පනස් නවයයි ශත හතලිස් අටක් 2014.07.10 වන දිනට ගෙවිය යුතු මුළු හිඟ මුදල දේපල විකිණීමේ දින දක්වා යුනියන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට ලැබී ඇති බලතල යටතේ බැංකුකරුවන්ගේ ණය අයකර ගැනීමේ පනතේ අංක 04-1990 (විශේෂ විධිවිධාන) සහ වගන්ති 03 අනුකූලව ඉහත බැඳි සිටින්නා විසින් ඉහත සඳහන් ණය හිඟ මුදල් පැහැර හැරීම කර ඇති බවට එකී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෑහීමකට පත්වී ඇති හෙයින් සහ එකී පනතේ අංක 4-1990 වගන්තිය 04 යටතේ ත්‍රිවන්ක සහ සේනානායක ලියාපදිංචි වෙන්දේසිකරු විසින් ඉහත කී ණය බැඳුම්කර අංක 1248, 1379 සහ අංක 1621 සහ 1821 දරන වැරදි නිවැරදි කිරීමේ ඔප්පුව යටතේ කියවෙන පහත උපලේඛනයේ මනාව දැක්වෙන දේපල එකී වෙන්දේසිකරුවන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා 2014.07.09 දක්වා අයවිය යුතු මුළු හිඟ මුදල සහ පොළිය වන රුපියල් තුන් මිලියන පන් ලක්ෂ විසි පන් දහස් පන්සිය පනස් නවයයි ශත හතලිස් අටකට අයකර ගැනීමට (එකී ණය පහසුකම් යටතේ නියමයන්ට අනුව) සහ යුනියන් බැංකුව හිමි එකී ණයකර බැඳුම් අංක 1248, 1379, 1621 සහ වැරදි නිවැරදි කිරීමේ ඔප්පු අංක 1821 යටතෙත් කියවෙන සහ එකී පනතේ අංක 04 වගන්ති 03 යටතේ වන එකී දේපල විකුණා යුනියන් බැංකුවට අයකර ගැනීමට.

උපලේඛනය

අවසරලත් මිනින්දෝරු ඒ. සී. එස්. ගුණරත්න මහතා විසින් මැන සාදන ලද අංක 4775 සහ 1964 ඔක්තෝබර් 27 වන දින, කටුනායක, දාසියපත්තු අලුත්කුරු කෝරළේ අඹගහවත්ත නම් ඉඩමේ පිඹුරේ කැබලි අංක ඒ - බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව කොට්ඨාසයේ සීදූව නගර සභා සීමාව තුළ කුරණ කටුනායක ගමේ පිහිටි ඉඩමට මායිම්.

උතුරට : ශ්‍රී ලංකා ගුවන් හමුදා පාර ; නැගෙනහිරට : අඩි 07ක පාරක් සඳහා වෙන් කරන ලද ඒ 01 දරන බිම් කැබැල්ල ; දකුණට : අංක බී දරන බිම් කැබැල්ල ; බස්නාහිරට : සාමෙන් සිල්වාට අයත් ඉඩම. (ප්‍රමාණය අක්. 0, රූ. 0, පර්. 27) සහ බලයලත් මිනින්දෝරු පී. ඩී. එන්. පීරිස් මහතා විසින් නැවත මැන සකස් කරන ලද පිඹුරු අංක 1217 සහ 1998 ජූලි 21 කැබලි අංක 01 වශයෙන් සඳහන් ඉඩමේ පිඹුරු අංක 1217 පරිදි,

උතුරට : ශ්‍රී ලංකා ගුවන් හමුදා පාර ; නැගෙනහිරට : පුද්ගලික පාර ; දකුණට : මානෙල් ශ්‍රේරූට අයත් ඉඩම ; බස්නාහිරට : ඉන්ද්‍රානි ගුණරත්නට අයත් ඉඩම. (ප්‍රමාණය අක්. 0, රූ. 0, පර්. 25.20) හෝ හෙක්ටයාර් 0.0637, පී. ඩී. එන්. පීරිස් අවසරලත් මිනින්දෝරු විසින් ඊට පසුව මැන සාදන ලද අංක 4113 - 2010 පෙබරවාරි 10 දින පිඹුරේ කැබලි අංක 01 මායිම්.

උතුරට : ශ්‍රී ලංකා ගුවන් හමුදා පාර ; නැගෙනහිරට : පුද්ගලික පාර ; දකුණට : මානෙල් ශ්‍රේරූට අයත් ඉඩම ; බස්නාහිරට : ඉන්ද්‍රානි ගුණරත්නට අයත් ඉඩම.

ඉඩමේ ප්‍රමාණය පර්චස් 25.20 හෝ හෙක්ටයාර් 0.0637 (ඉඩමේ කාර්යාලයේ C812/182 යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඒ. ඩී. එන්. එස්. කන්නන්ගර,
මණ්ඩලයේ ලේකම්.

10 - 239

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2014 අගෝස්තු මස 26 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව නමට හොරණ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. එම්. යූ. කේ. ජයවර්ධන විසින් ලියා සහතික කළ අංක 279 සහ 2010 නොවැම්බර් 08 දින ද අංක 286 හා 2010 දෙසැම්බර් 23 දින ද අංක 451 හා 2012 පෙබරවාරි 17 දිනද අංක 541 හා 2013 ජනවාරි 23 දින ද දරන උකස් බැඳුම්කර මත, අයවිය යුතු මුදල් ගෙවීම්, හොරණ, කිරිකංකානමගේ ගයාන් දමින්ද පෙරේරා යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2014 ජූනි 30 වන දිනට ඉහත කී ඉහත අංක 279, 286, 451 සහ 541 දරන උකස් බැඳුම්කර මත එකී කිරිකංකානමගේ ගයාන් දමින්ද පෙරේරා යන අයගෙන් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවට රුපියල් අනූලක්ෂ හැටපන්දහස් හාරසිය පහළොවකුත් ශත හැටහතරක (රු. 90,65,415.64) මුදලක් සහ 2014 ජූලි 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිලක්ෂ අනූ එක් එක්දහස් නවසිය හැත්තෑහතකුත් ශත හතලිස් දෙකක් (රු. 20,91,977.42) සඳහා සෑම තුන්මසකට වරක් ප්‍රතිශෝධන දිනය වූ එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරන, බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී.ආර්.) වර්ෂයකට සියයට පහකුත් දශම පහක් (5.5%) ඉහල අනුපාතිකය මත ගණනය කළ පොලියද, රුපියල් විසිදෙලක්ෂ අසූපන්දහස් අටසිය තිස් දෙකකුත් ශත එකක් (රු. 22,85,832.01) සඳහා සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධන දිනය වූ එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරන, බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකය මත ගණනය කළ පොලිය ද, රුපියල් හතළිස් හය ලක්ෂ විසිතුන් දහස් එකසිය තිහකුත් ශත පනහක් ද (රු. 46,23.130.50) සඳහා වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් ගණනය කළ පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් අනූලක්ෂ හැටපන්දහස් හාරසිය පහළොවකුත් ශත හැටහතරක (රු. 90,65,415.64) මුදලක් සහ 2014 ජූලි 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් විසිලක්ෂ අනූ එක් එක්දහස් නවසිය හැත්තෑහතකුත් ශත හතලිස් දෙකක් (රු. 20,91,977.42) සඳහා සෑම තුන්මසකට වරක් ප්‍රතිශෝධන දිනය වූ එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම දිනයේදී ප්‍රතිශෝධනය කරන, බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒඩබ්ලිව්.පී.ආර්.) වර්ෂයකට සියයට පහකුත් දශම පහක් (5.5%) ඉහල අනුපාතිකය මත ගණනය කළ පොලිය ද, රුපියල් විසිදෙලක්ෂ අසූපන්දහස් අටසිය තිස් දෙකකුත් ශත එකක් (රු. 22,85,832.01) සඳහා සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධන දිනය වූ දිනයේදී ප්‍රතිශෝධනය කරන, බරතැබූ මධ්‍යක මූලික ණය පොලී එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් මාසවල ව්‍යාපාර කටයුතු කරන ප්‍රථම අනුපාතිකයට (ඒ.ඩබ්ලිව්.පී. ආර්) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකය මත ගණනය කළ පොලිය ද, රුපියල් හතළිස් හය ලක්ෂ විසිතුන් දහස් එකසිය තිහකුත් ශත පනහක් ද (රු. 46,23.130.50) සඳහා වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් ගණනය කළ පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම, පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 40 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13වන වගන්තිය ප්‍රකාර එකී අංක 279, 286, 451 හා 541 දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තුද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 279, 286, 451 හා 541 දරන උකස් බැඳුම්කර මගින් කිරිකංකානමගේ ගයාන් දමින්ද පෙරේරා යන අය විසින් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම, ගොඩනැගිලි හා එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 279, 286, 451 හා 541 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපල විස්තරය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, හොරණ ප්‍රාදේශීය සභා ප්‍රදේශ සීමාව ඇතුළත, ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 621 රත්මල්ගොඩ ග්‍රාම නිලධාරී වසමේ, කලුපහන ග්‍රාමයේ පිහිටි "අතලේ කුඹුර" යනුවෙන් හැඳින්වෙන ඉඩමේ

බලයලත් මානක යූ. තිලකා නන්දනී මැන සකස් කල අංක 1251 හා 2004.07.02 දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කල බිම් කට්ටිය වූ බෙදා වෙන්කළ බිම් කට්ටියට මායිම්, උතුරට : මෙම ඉඩමේ එල්. දයාරත්නට අයිති කොටස ද ; නැගෙනහිරට : පෝරුවදණ්ඩ සිට හඳපාන්ගොඩට යන මහ පාර ද ; දකුණට : මෙම ඉඩමේ කේ. දයාරත්න පෙරේරාට අයිති කොටස ද ; බස්නාහිරට : මෙම ඉඩමේ එල්. දයාරත්නට අයිති කොටසක් ද යන මායිම් ඇතුළත එකී අංක 1251 දරන පිඹුර ප්‍රකාර පර්චස් විසිඑකකුත් දශම පහක් (අ. 0, රූ. 0, පර්. 21.5) නොහොත් හෙක්ටෙයාර 0.0544ක බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම හොරණ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ලක්ෂ්මන් සිල්වා,
ප්‍රධාන විධායක නිලධාරී.

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් ලිමිටඩ්,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

10 - 278

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මහියංගනය ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සීහි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

අනුර ගාර්දි පුංචිහේවා.

2014 අප්‍රේල් මස 24 දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පෙරේරා විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.හි නමට ලියන ලද්දා වූ ද, 2011 මැයි 06 දින සහතික කළ අංක 2385, 2011 මැයි 06 දින සහතික කළ අංක 2386, 2011 අගෝස්තු 23 දින සහතික කළ අංක 2521, 2012 ජූලි 10 දින සහතික කළ අංක 2845, 2013 ජූලි 10 දින සහතික කළ අංක 2846 සහ 2013 නොවැම්බර් 06 දින සහතික කළ අංක 3376 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අනුර ගාර්දි පුංචිහේවා යන අය ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් හාරකෝටි පනස්ලක්ෂ පනස්දහස් අටසිය හතලිස්නමයයි ශත හතළිස් එක (රු. 4,50,50,849.41) ක මුදලක් 2014 පෙබරවාරි 18 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 4,50,50,849.41ක මුදල අයකර ගැනීම සඳහා සහ 2014 පෙබරවාරි 19 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද, ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද, තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එම මුදල අඩු කොට එකී අංක 2385, 2386, 2521, 2845, 2846 සහ 3376 දරන බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස් කොට ඇත්තා වූ ද, මෙහි පහත පළමුවන, දෙවන, තුන්වන, හතරවන සහ පස්වන උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ ද, දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනාව සම්මත කර ගනී.

පළමුවන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ තිරගංදහය කෝරලේ අකරගනේ ගමේ පිහිටි ගම්මාලුගොල්ලහේන හෙවත් ගම්මඩුගොල්ලහේන දැන් වත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එස්. ගලගෙදර විසින් 2007 දෙසැම්බර් 25 වැනි දින සාදන ලද අංක 8524 දරන පිඹුරෙන් බෙදා වෙන් කොට ඇති ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වන ඊසානට : පිඹුරු අංක 91/28හි ලොට් 1 ද ; ගිණිකොණට : කේ. කනගසිංහම් විසින් සාදන ලද පිඹුරු අංක 91/28 හි ලොට් 4 දරන අඩි 12ක් පළල පාර ද ; දකුණට : පිඹුරු අංක 7871හි ලොට් 1හි ඉතිරි කොටස සහ පිඹුරු අංක 7871 හි ලොට් 2 ද සහ ; වයඹට : පිඹුරු අංක 7871 හි ලොට් 1බී විජේසිංහට අයත් ඉඩමෙන් ද මායිම් වූ පර්චස් දොළහයි දශම හයයි එක (අ. 0, රූඩ්, 0, පර්. 12.61)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කුරුණෑගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1244/293 යටතේ ලියාපදිංචි කර ඇත.

දෙවන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ තිරගංදහය කෝරලේ දොරටියාව ගමේ පිහිටි කරඹේ එස්ටේට් නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. කේ. පෙරේරා විසින් 2006 ජනවාරි 29 වැනි දින සාදන ලද අංක 1124-සී දරන පිඹුරේ ලොට් 41 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් උතුරට : ලොට් 42 ද ; නැගෙනහිරට : ලොට් 25 (මීටර් 6ක් පළල පාර) ද ; දකුණට : ලොට් 40 ද සහ බස්නාහිරට : වෙන්නරාව වැව සහ ලොට් 49න් ද මායිම් වූ පර්චස් පහළොවක (අ. 0, රූඩ්, 0, පර්. 15)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි එහි පිහිටි සියලු දේත් සමග වන මෙය කුරුණෑගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 1768/110 යටතේ ලියාපදිංචි කර ඇත.

තුන්වන උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගඟවට කෝරලේ මහනුවර මහනගර සභා සීමාවේ මහයියාවෙහි පිහිටි වරිපනම් අංක 214 දරන මහයියාවවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. ආර්. ඩබ්. එම්. වීරකෝන් විසින් 2006 ඔක්තෝබර් 02 වන දින සාදන ලද අංක 15294 දරන පිඹුරේ ලොට් 6 දරන ඉඩමට මායිම් වන උතුරට : ජෝමුවාගේ වත්ත ද ; ඊසානට සහ නැගෙනහිරට : දුම්රිය මාර්ගයේ සිට නිවෙස් කරා යන අඩි පාර සහ කටුගස්තොට - මහනුවර ප්‍රධාන මාර්ගය ද ; දකුණට : කටුගස්තොට-මහනුවර ප්‍රධාන මාර්ගය ද සහ ; බස්නාහිරට : ඉහත සඳහන් පිඹුරේ ලොට් 5 සහ 7 වශයෙන් වෙන්කරන ලද තාප්පයෙන් මායිම් වූ පර්චස් හතයි දශම හයයි හය (අ. 0, රූඩ්, 0, පර්. 7.66)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි එහි පිහිටි සියලු දේත් සමග වන මෙය මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව සී 388/288 යටතේ ලියාපදිංචි කර ඇත.

හතරවන උපලේඛනය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර ගඟවට කෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහනුවර මහනගර සභා සීමාවේ 234 අනිවත්ත නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ නුවර-දොඩංවල ගමේ පිහිටි වරිපනම් අංක 103 දරන අනිවත්ත හි කොටස නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. පී. රූපසිංහ විසින් 2014 ජනවාරි 10 වැනි දින සාදන අංක

3095 දරන පිඹුරේ ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වන ඊසානට : මෙම ඉඩමේම ඉතිරි කොටස (බලයලත් මිනින්දෝරු ඩී. ඒ. ජයගොඩ විසින් සාදන ලද අංක 626 දරන පිඹුරේ ලොට් 13හි ඉතිරි කොටස) ද ; ගිණිකොණට : අනිවත්ත පාර ද ; නිරිතට : බලයලත් මිනින්දෝරු ජේ. සී. ගමගේ විසින් සාදන ලද අංක 233 දරන පිඹුරේ ලොට් 1 ලෙස දැක්වෙන මෙම ඉඩමෙහිම කොටස් ද සහ ; වයඹට : මෙම ඉඩමෙහිම ඉතිරි කොටස බලයලත් මිනින්දෝරු ඩී. ඒ. ජයගොඩ විසින් සාදන ලද අංක 626 දරන පිඹුරේ ලොට් 12හි ඉතිරි කොටසට මායිම් වූ පර්චස් දහයයි දශම දෙකයි පහ (අ. 0, රූඩ්, 0, පර්. 10.25)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි එහි පිහිටි සියලු දේත් සමග වන මෙය මහනුවර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඒ 393/256 යටතේ ලියාපදිංචි කර ඇත.

පස්වන උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඩවිල්ලි හත්පත්තුවේ තිරගංදහය කෝරළයේ, කුරුණෑගල මහනගර සභා සීමාවේ මල්කඩුවාව පාරේ පිහිටි මල්කඩුවාව වටරවුම් පාරේ වරිපනම් අංක 48 දරන ගම්මඩුගොඩැල්ලවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එස්. පෙරේරා විසින් 1977 අප්‍රේල් 22 වැනි දින සාදන ලද අංක 631 (CH/0/4/ 5225/1828) දරන පිඹුරේ ලොට් 04 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වන උතුරට : පිඹුරු අංක 3173 හි දැක්වෙන ලොට් 22 සහ 24 ; නැගෙනහිරට : පිඹුරු අංක 3173හි ලොට් 4 සහ වරිපනම් අංක 46 මල්කඩුවාව පාර ද ; දකුණට : මල්කඩුවාව පාර ද සහ බස්නාහිරට : ෆලවර් පාරෙන් ද මායිම් වූ පර්චස් විසිහතයි දශම දෙකයි පහ (අ. 0, රූඩ්, 0, පර්. 27.25)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි එහි පිහිටි සියලුම දේත් සමග වන මෙය කුරුණෑගල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්ඉරුව ඒ 1423/294 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් ඉඩම මෑතක දී කළ මැනීමකින් පසුව පහත සඳහන් පිරිදි විස්තර කොට ඇත.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඩවිල්ලි හත්පත්තුවේ තිරගංදහය කෝරළේ කුරුණෑගල මහනගර සභා සීමාවේ මල්කඩුවාව පාරේ මල්කඩුව වටරවුම් පාරේ වරිපනම් අංක 48 දරන ගම්මඩු ගොඩැල්ලවත්ත නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එස්. ගලගෙදර විසින් 2005 දෙසැම්බර් 06 වැනි දින සාදන ලද අංක 7839 දරන පිඹුරේ ලොට් 01 වශයෙන් දැක්වෙන ඉඩමට මායිම් වන උතුරට : පිඹුරු අංක 3173හි දැක්වෙන ලොට් 22 රූපසිංහගේ ඉඩම සහ පිඹුරු අංක 3173හි ලොට් 34 වශයෙන් දැක්වෙන අඩි 3ක් පළල පාර සහ පුනාවර්ධනගේ ඉඩම ද ; නැගෙනහිරට : පිඹුරු අංක 3173හි ලොට් 4 සහ රණසිංහට අයිති ඉඩම ද ; දකුණට : මීගමුව-කොළඹ ප්‍රධාන පාරට වැටෙන මල්කඩුවාව වටරවුම් පාර ද සහ ; බස්නාහිරට : ෆලවර් පාරෙන් නිවෙස් කරායන (මහනගර සභා පාරෙන්) මායිම් වූ පර්චස් විසිහතයි දශම දෙකයි පහ (අ. 0, රූඩ්, 0, පර්ත 27.25)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි එහි පිහිටි සියලු දේත් සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි

කේ. ඒ. එල්. ටී. රණවීර,
සහකාර සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

10 - 287

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2014 ජූලි මස 30 දින දී එක්ච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව ලෙස කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ජයසිංහ විසින් ලියා සහතික කළ අංක 411 සහ 2005 අප්‍රේල් 05 දින ද, සී. පී. ඩබ්ලිව්. මීගහවෙල ලියා සහතික කළ අංක 72 සහ 73 හා 2011 සැප්තැම්බර් 26 දිනය ද, දරන උකස් බැඳුම්කරය අයවිය යුතු මුදල් ගෙවීම්, සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර තිබෙන ලියාපදිංචි අංක PV 5110 දරන (පූර්ව ලියාපදිංචි අංකය N(PVS) 32841 වූ) සහ ලියාපදිංචි කාර්යාලය, රාජගිරිය, නාවල පාර අංක 575 දරන ස්ථානයේ පිහිටා තිබෙන මෙහි මින් ඉදිරියට "එකී සමාගම" යනුවෙන් සඳහන් කරන) සමාගමක් වන ඔරු මික්ස් ඇස්ෆෝල්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම විසින් පැහැර හැර ඇති ,

2014 අප්‍රේල් 30 වැනි දිනට ඉහත කී ඉහත 411, 72 සහ 73 උකස් බැඳුම්කර මත එකී ඔරු මික්ස් ඇස්ෆෝල්ට් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමෙන් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවට රුපියල් හත්කෝටි නවලක්ෂ හතළිස්හත් දහස් හත්සිය අනූනවයකුත් ශත පණස් අටක (රු. 7,09,47,799.58) මුදල් ප්‍රමාණයක් සහ එයින් රුපියල් තුන්කෝටි එක් ලක්ෂ හැත්තෑහය දහස් නවසිය විසිනවයකුත් ශත තුනක් (රු. 3,01,76,929.03) සඳහා වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් ගණනය කළ පොළියද, රුපියල් දෙකෝටි අනූහත් ලක්ෂ පණස්තුන් දහසක (රු, 2,97,53,000) මුදලක් සඳහා වර්ෂයකට සියයට (20%) බැගින් ගණනය කළ පොළියද රුපියල් හැත්තෑහතර ලක්ෂ විසිහතර දහස් එකසිය හැටක (රු, 74,24,160) මුදලක් හා වර්ෂයයට (26%) බැගින් ගණනය කළ පොළිය ද ලැබිය යුතුව අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල වන රුපියල් හත්කෝටි නවලක්ෂ හතළිස්හත් දහස් හත්සිය අනූනවයකුත් ශත පණස් අටක (රු. 7,09,47,799.58) මුදල් ප්‍රමාණයක් සහ එයින් රුපියල් තුන්කෝටි එක් ලක්ෂ හැත්තෑහය දහස් නවසිය විසිනවයකුත් ශත තුනක් (රු. 3,01,76,929.03) සඳහා වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් ගණනය කළ පොළියද, රුපියල් දෙකෝටි අනූහත් ලක්ෂ පනස්තුන් දහසක (රු, 2,97,53,000) මුදලක් සඳහා වර්ෂයකට සියයට (20%) බැගින් ගණනය කළ පොළිය ද රුපියල් හැත්තෑහතර ලක්ෂ විසිහතර දහස් එකසිය හැටක (රු, 74,24,160) මුදලක් හා වර්ෂයයට (26%) බැගින් ගණනය කළ පොළිය ද විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී අංක උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තුද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 411, 72 සහ 73 දරන උකස් බැඳුම්කර මගින් සමාගමේ අධ්‍යක්ෂවරුන් වන, දෙදෙනාම කොළඹ

වෙසෙන ජයලත් සේනාරත්නගේ ලසන්ත සේනාරත්න සහ බුලත්සිංහලගේ අයිෂා වරුණි සේනාරත්න විසින් සමාගම සඳහා සහ වෙනුවෙන් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය ද, සහ

ඉහත කී අංක 411 සහ 73 දරන උකස් බැඳුම්කර මගින් ඔරු මික්ස් ඇස්ෆෝල්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තරක කර තිබෙන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ නිදහස්ව දැරීමේ අයිතිවාසිකම් (Free Hold rights) ද,

ඉහත කී අංක 72 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩමට හා පරිශ්‍රයට ඇති බදුකර අයිතිවාසිකම් (Lease Hold Rights) සහ එහි තිබෙන පිරියත, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ වෙනත් සියලු දේ ද කොළඹ, බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 411 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කර තිබෙන දේපළ විස්තරය

පුත්තලම දිස්ත්‍රික්කයේ, මාදම්පේ, සුදුවැල්ලේ පිහිටා තිබෙන ඔරු මික්ස් ඇස්ෆෝල්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම් පරිශ්‍රය තුළ සහ මත දැනට තිබෙන පහත සඳහන් සියලු චංචල පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ ඇතුළුව, එනම් :

විස්තරය *ප්‍රමාණය*

1. බිටුමන් ඇස්ෆෝල්ට් ප්ලාන්ට්
 වර්ගය - ශිං සැංග් ප්‍රිමික්ස් යන්ත්‍රාගාරය
 නිෂ්පාදන ශක්තිය - පැයට ටොන් 60-80
 මිශ්‍රක ධාරතාතව කි.ග්‍රෑ. 1000
 මෝස්තරය - TSAP 1000 - රසායනාගාර උපරකණ සමග

2. එමල්ෂන් ප්ලාන්ට්
 කේතලය - ලීටර් 6000 x 2
 හොට් ඔයිල් හීටරය
 ස්ටොරේජ් ටැන්ක් විත් ලැගිං මැටීරියල්
 ගෑස් ස්ටොරේජ් ටැන්ක්
 කුලිං ටැන්ක්

3. යන්ත්‍ර (සුමිටෝමෝ පේවර් ට්‍රැක්ටයිප් - සකාහි රබර් රෝලර්)

4. බවුසර් ටැංකි රථ
 කැරොසින් ට්‍රැක්ටර් බ්‍රවුසර්
 කැරොසීන් ට්‍රේලර් බ්‍රවුසර්
 ඇස්ෆෝල්ට් ටැන්කර්

සහ අමතර කොටස්, උපාංග හා මෙවලම් ඇතුළුව, දැනට පුත්තලම් දිස්ත්‍රික්කයේ, මාදම්පේ සුදුවැල්ලේ, ඔරු මික්ස් ඇස්ෆෝල්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ පරිශ්‍රයේ සහ එකී සමාගම දැනට ව්‍යාපාරය කරගෙන යන හා මින් මතු යම් කාලයක හා කලින් කල ව්‍යාපාරය කරගෙන යනු ලැබිය හැකි වෙනත් යම් ගුදම්, ගබඩා හා පරිශ්‍ර තුළ හා මත නැතහොත් එකී චංචල පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ අමතර කොටස්, උපාංග හා මෙවලම් ද, කලින් කල ගබඩා කර තබා හෝ දමා තැබිය හැකි යන්ත්‍ර, සූත්‍ර, උපකරණ සහ අමතර කොටසක්, උපාංග හා මෙවලම් ද ඉහත කී චංචල පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ අමතර කොටස්, උපාංග හා මෙවලම් වෙනුවට ප්‍රතියෝජනය කිරීම පිණිස කලින් කල සහ සෑම කල්හිම ඉහත කී ගබඩා, ගුදම් සහ පරිශ්‍රවලට ගෙනු එනු ලබන හෝ ගෙනඑනු ලැබිය හැකි අන් ස්ථානයක තබා හෝ දමා තිබිය හැකි සියලු පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපරකණ සහ අමතර කොටස් උපාංග හා මෙවලම් ද සමග සමාගම එහි ව්‍යාපාරය ගෙනඑනු ලැබිය හැකි ස්ථානයකට හෝ එකී චංචල පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ හා අමතර කොටස්, උපාංග හා මෙවලම් ඉවත් කරගෙන යනු ලැබිය හැකි ස්ථානයක ඇති එකී සියලු පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ අමතර කොටස්, උපාංක හා මෙවලම් සමග සම්පූර්ණ දේපළ.

අංක 72 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, කිතලවලාන ග්‍රාමයේ පිහිටි බුලනෙකන්ද නමැති රජයේ ඉඩමේ, කොටස් වූ බිම් කොටසට මායිම්,

උතුරට : කුකන්හේන ඇළ ද, නැගෙනහිරට : එම්. සී. පෙරේරා විසින් සිදුකර තිබෙන බුලන්කන්දේ ප්‍රසර්පණය, පී.පී. අංක 18290 ලොට් අංක 2, ටී.පී.එස්. 360980 සහ 355677 සහ ලොට් අංක 1 ද, දකුණට : ලොට් අංක 7 ද, බස්නාහිරට : ලොට් අංක 5, 3 සහ 1 හා ටී.පී. 78212 යන මායිම් ඇතුළත අක්කර අටකුත් රූඩ් එකකුත් පර්චස් තිස්නවයක් (අ. 8, රූ. 1, ප. 39) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම, මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 182/85 වෙළුවේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර තිබේ.

2. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, කිතලවලාන ග්‍රාමයේ පිහිටි බුලනෙකන්ද නමැති ඇතුළත පිහිටි එනම්

උතුරට : ටී. පී. අංක 96839 පිඹුර ප්‍රකාර හිමිකම් කියන ඉඩම ද ; නැගෙනහිරට : ටී.පී. අංක 96839 දරන පිඹුර ප්‍රකාර හිමිකම් කියන ඉඩම බුලනෙකන්ද දොළ, ටී.පී. අංක 355675 සහ ලොට් අංක 16 ; දකුණට : ටී.පී. අංක 355677 සහ 360980 ද ; බස්නාහිරට : ටී.පී. අංක 360980, මළ දොළ, ලොට් අංක 2 සහ ටී.පී. අංක 96839 පිඹුර ප්‍රකාර හිමිකම් කියන ඉඩම යන මායිම් ඇතුළත බුලනෙකන්ද දොළ සහ මළ දොළ අත්හැර අක්කර දොළහකුත් රූඩ් දෙකකුත් පර්චස් තිස්නවයක් (අ. 12, රූ. 2, ප. 39) බිම් ප්‍රමාණයෙන් යුක්ත සහ විශේෂයෙන් වැඩබලන සර්වේයර් ජනරාල් එල්. ජී. ඕ. වුඩ්හවුස් මහතා විසින් සහතික කරන ලද අංක 5908 හා 5909 හා 1937 සැප්තැම්බර් 25 දින දරන බදු පිඹුරේ රේඛන සටහනින් නිරූපිතව (delineated) බදු පිඹුරේ විස්තර කර තිබෙන ඉඩම. මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 182/86 වෙළුවේ/පත්‍රිරුවේ ලියාපදිංචි කර තිබේ.

අංක 73 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, හාපිටිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත කිතලවලානේ පිහිටි "බුලනෙකන්ද නොහොත් මුකලන්හේන සහ තලගහලන්ද නැමති ඉඩමේ, බලයලත් මානක ආර්. ඒ. චන්ද්‍රරත්න මැන සකස් කළ අංක 5045 හා 1991 මැයි 17 දින දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන්කල බිම් කොටසට මායිම්,

උතුරට : බලයලත් මානක අයි. ඒ. සී. සේනාරත්න මැන සකස් කළ අංක 285 පිඹුරේ ලොට් F ද ; නැගෙනහිරට : බලයලත් මානක අයි. ඒ. සී. සේනාරත්න මැන සකස් කළ අංක 285 පිඹුරේ ලොට් C ද ; දකුණට : බලයලත් මානක අයි. ඒ. සී. සේනාරත්න මැන සකස් කළ අංක 285

පිඹුරේ ලොට් R ද, බස්නාහිරට : එකී අංක 285 පිඹුරේ ලොට් A ද යන මායිම් ඇතුලත ඉහත කී අංක 5045 දරන පිඹුර ප්‍රකාර අක්කර පහකුත් පර්චස් දොළහක් (අ. 5, රූ. 0, ප. 12) නොහොත් හෙක්ටයාර 2.0538ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම, හා එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ, මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ F 298/35, 36 යටතේ ලියාපදිංචි කර තිබේ.

ඉන් මෑතකදී මැන සකස් කළ පිඹුරකට අනුව ඉහත දැක්වෙන ඉඩම සහ පහත සඳහන් පරිදි විස්තර කර තිබේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ, හාපිටිගම් කෝරළේ, උඩුගහ පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත කිතලවලානේ පිහිටි "බුලනෙකන්ද නොහොත් මූකලන්හේන සහ තලගහලන්ද නැමති ඉඩමේ, බලයලත් මානක වරුණ අජන්ත යාපා මැන සකස් කළ අංක 1053 හා 2005 සැප්තැම්බර් 22 වැනි දින දරන පිඹුරේ නිරූපිත ලොට් අංක 1 ලකුණු කළ බිම් කොටස වූ බෙදා වෙන්කල ඉඩමට මායිම්, උතුරට : බලයලත් මානක අයි. ඒ. සී. සේනාරත්න මැන සකස් කළ අංක 285 පිඹුරේ ලොට් F ද, නැගෙනහිරට : බලයලත් මානක අයි. ඒ. සී. සේනාරත්න මැන සකස් කළ අංක 285 පිඹුරේ ලොට් C සහ පාර, දකුණට : බලයලත් මානක අයි. ඒ. සී. සේනාරත්න මැන සකස් කළ අංක 285 පිඹුරේ ලොට් R4 ද, බස්නාහිරට : එකී අංක 285 පිඹුරේ ලොට් A ද යන මායිම් ඇතුලත ඉහත කී අංක 1053 දරන පිඹුර ප්‍රකාර අක්කර පහකුත් පර්චස් දොළහක් (අ. 5, රූ. 0, ප. 12) නොහොත් හෙක්ටයාර 2.0538 ක් බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම, හා එහි පිහිටි ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ.

ලක්ෂ්මන් සිල්වා
ප්‍රධාන විධායක නිලධාරී.

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී,
අංක 73,
ඩබ්ලිව්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

10 - 282

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
සංශෝධිත ගාස්තු

2014 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

සියලුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

	රු. ශ.
අඟලකට හෝ ඉන් අඩුව	137 0
වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට	137 0
තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට	1,300 0
තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට	2,600 0

(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

	වාර්ෂික දායක මුදල	*තැපැල් ගාස්තුව*
	රු. ශ.	*රු. ශ.*
I වැනි කොටස :		
I වැනි ඡේදය	4,160 0	9,340 0
II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය)	580 0	950 0
III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය)	405 0	750 0
I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව)	890 0	2,500 0
II වැනි කොටස (අධිකරණ)	860 0	450 0
III වැනි කොටස (ඉඩම්)	260 0	275 0
IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ...	2,080 0	4,360 0
V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය)	1,300 0	3,640 0
VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ...	780 0	1,250 0
අති විශෙෂ ගැසට් පත්‍රය...	5,145 0	5,520 0

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)

* තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

	පිටපතක මිල	තැපැල් ගාස්තුව
I වැනි කොටස :	*රු. ශ.*	*රු. ශ.*
I වැනි ඡේදය	40 0	60 0
II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය)	25 0	60 0
III වැනි ඡේදය	15 0	60 0
I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව)	80 0	120 0
II වැනි කොටස	12 0	60 0
III වැනි කොටස	12 0	60 0
IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්)	23 0	60 0
V වැනි කොටස	123 0	60 0
VI වැනි කොටස	87 0	60 0

*** කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.**

ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.

සැළකිය යුතුයි. - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

උපලේඛනය

මාසය	*පළ කිරීමේ දිනය*		*ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව*			
			2014			
ඔක්තෝබර්	2014.10.03	සිකුරාදා	2014.09.19	සිකුරාදා	දහවල්	12.00
	2014.10.10	සිකුරාදා	2014.09.26	සිකුරාදා	දහවල්	12.00
	2014.10.17	සිකුරාදා	2014.10.03	සිකුරාදා	දහවල්	12.00
	2014.10.24	සිකුරාදා	2014.10.10	සිකුරාදා	දහවල්	12.00
	2014.10.31	සිකුරාදා	2014.10.17	සිකුරාදා	දහවල්	12.00
නොවැම්බර්	2014.11.07	සිකුරාදා	2014.10.24	සිකුරාදා	දහවල්	12.00
	2014.11.14	සිකුරාදා	2014.10.31	සිකුරාදා	දහවල්	12.00
	2014.11.21	සිකුරාදා	2014.11.07	සිකුරාදා	දහවල්	12.00
	2014.11.28	සිකුරාදා	2014.11.14	සිකුරාදා	දහවල්	12.00
දෙසැම්බර්	2014.12.05	සිකුරාදා	2014.11.21	සිකුරාදා	දහවල්	12.00
	2014.12.12	සිකුරාදා	2014.11.28	සිකුරාදා	දහවල්	12.00
	2014.12.19	සිකුරාදා	2014.12.05	සිකුරාදා	දහවල්	12.00
	2014.12.26	සිකුරාදා	2014.12.12	සිකුරාදා	දහවල්	12.00

පී. එච්. එල්. වී. ද සිල්වා,
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2014 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.